**29-11-2024 උදෑසන මුරලි ඕම් ශාන්ති බාප්දාදා මධුබන්**

**සාරය:** සුමිහිරි දරුවනි, ඔබ ශිව බාබාව අගේ කොට සලකනවා නම්, ඔහුගේ ශ්‍රීමත් දිගටම පිළිපදින්න. ශ්‍රීමත් පිළිපැදීම යනු පරම පියාව අගේ කොට සැලකීම වේ.

**ප්‍රශ්නය:** ඔබ පරම පියාටත් වඩා ලොකු මැජික්කරුවන් වන්නේ කොහොමද?

**පිළිතුර:** උසස්ම උසස් පියාව ඔබේ දරුවා කරගන්න. පියාව ඔබේ උරුමක්කාරයා කර, ඔබේ ශරීර, මනස සහ ධනය ආදිය ඔහුට භාරකිරීම තමයි ඔය දරුවන්ගේ මැජික් එක. දැන්ම පරමාත්ම දෙවියන්ව තම උරුමක්කාරයා කරගත්තන් උපත් 21ක් සඳහා උරුමය ලබාගන්නවා ඇත.

**ප්‍රශ්නය:** කොයි දරුවන් සඳහාද විනිශ්චය සභාව පවත්වන්නේ?

**පිළිතුර:** විනිශ්චය සභාව පවත්වන්නේ තමන් දානය කළ දේ ආපසු ගැනීමට සිතනා අය වෙනුවෙනුත්, මායාගේ බලපෑම නිසා අවසේවය කරනා අය වෙනුවෙනුත්ය.

ඕම් ශාන්ති. පරම්පිතා පරමාත්මය නමින් හඳුන්වන ආධ්‍යාත්මික, රූපයක් නොමැති ඒකායනය, සුවිශේෂී පියා. එනම්, ඈත එපිට දේශයේ වාසය කරන්නා මෙහි හිඳිමින් ඔබ සුවිශේෂී දරුවන්ට පැහැදිලි කරයි. ඔහු ඉතා ඈත එපිට දේශයෙන් පැමිණ මේ ශරීරය තුළින් ඔබට උගන්වනවා. ඉගෙන ගන්නා අය උගන්වන කෙනා සමඟ ඉබේ සම්බන්ධ වෙනවා. ඔහු ඔවුන්ට කීමට අවශ්‍ය නැත: ඕ දරුවනී. ඔබේ ගුරුවරයා හා යෝග වී සිටින්න හෝ ඔහුව සිහිපත් කරන්න කියා; නැහැ. මෙහිදී, පියා කියනවා : ඕ දරුවනි! ඒ කෙනා තමයි ඔබේ පියා, ගුරු සහ සත්ගුරු. ඔහු හා යෝග වන්න, ඒ කියන්නේ සිහිපත් කරන්න. ඔහු තමයි රුවක් නොමැති සුවිශේෂ බාබා. ඔබ නැවත නැවත ඔහුව අමතක කරයි. එමනිසායි, ඔබට කියන්නේ තමන්ට උගන්වන කෙනාව සිහිපත් කිරීමෙන් ඔබේ පාපයන් පිළිස්සී යනවා කියා. ගුරුවරයෙකු මෙසේ: මා දෙස බලන්න; එහි ලොකු වාසියක් තිබෙනවා යැයි කීම නීතිය නොවේ. පරම පියා කියයි : සරළව මා සිහිපත් කරන්න. මෙම ස්මෘති බලයෙන්ම පමණයි ඔබේ සියලු පාපයන් කැපී යන්නේ. මෙය ස්මරණ වන්දනාව යැයි හැඳින්වේ. දැන් ආධ්‍යාත්මික පියා ඔබ දෙස බලමින් සිටිනවා. ඔය දරුවන් තමන්ව ජීවාත්ම යැයි සලකමින් රුවක් නොමැති සුවිශේෂී පියාව සිහිපත් කරනවා. ඔබ ශරීර තුළට නැවත නැවත පුණරාවර්තනය වෙයි. මම මුළු චක්‍රය පුරාවටම ශරීරයක් නොගනිමි. මා ඈත එපිට දනව්වේ සිට ඔබට උගැන්වීම සඳහා පැමිණෙන්නේ මේ සංගම යුගයේදී පමණයි. හොඳින් මතක තබාගන්න: බාබා අපගේ පියා, ගුරුවරයා සහ සත්ගුරු වේ. රුවක් නොමැති කෙනා ඔහු වේ. ඔහුටම කියා ශරීරයක් නොතිබේ. ඉතින් ඔහු එන්නේ කොහොමද? ඔබ සැමටම රූප තිබෙනවා. මා හට රථයක් අනිවාර්යෙන් අවශ්‍යවෙයි. ඔහු අශ්ව රථයකින් නොඑනු ඇත. පරම පියා කියයි: මා මේ ශරීරය තුළට ඇතුල් වෙනවා. පළමු අංකයට පැමිණ පසුව අන්තිම අංකයට පත් වූ කෙනාගේ ශරීරය තුළට ඇතුල් වෙනවා. සතෝප්‍රධාන් වූවන් ඉන්පසු තමෝප්‍රධාන් වෙනවා. එමනිසා, නැවත වතාවක් ඔවුන්ව සතෝප්‍රධාන් කිරීමට පරම පියා උගන්වයි. ඔහු පැහැදිලි කරයි : රාවණ රජදහනේ මේ පස්පව් ජයගත්තන් (වික්‍රමජිත්) වන්නේත්, ඉන්පසු ලොව ජයගත්තන් (විශ්වජිත්) බවට පත්වන්නේත් ඔය දරුවන්මය. ඔබට උගන්වන රුවක් නැති පියාවයි ඔය දරුවන් සිහිපත් කරන්නේ. ඔබ පරම පියා සිහිපත් නොකරයි නම් ඔබේ පාප කෙසේ පිළිස්සෙන්න ද? දැන් ඔබ මේ සංගම යුගයේ දී මේ දේවල් අසයි. මෙකල යම් දෙයක් සිදුවේද එය චක්‍රයකට පසු නැවත සිදුවේවි. මෙය එවන් හොඳ විවරණයකි. මේ සඳහා ඉතා පුළුල් සහ අසීමිත බුද්ධියක් අවශ්‍ය කරයි. මෙය මුනිවරයෙකු හෝ ශාන්තුවරයෙකුගේ සභාවක් නොවෙයි. ඔහුව ඔබේ පියා කියාත් ඔබේ දරුවා කියාත් ඔබ හඳුන්වයි. ඔහු ඔබේ පියාත් ඒ වාගේම ඔබේ දරුවාත් කියා ඔබ දන්නවා. උරුමය වශයෙන් අප සතු සියල්ලක්ම එම දරුවාට භාරදෙනවා. උපත් 21ක් සඳහා උරුමය පරම පියාගෙන් අප ලබනවා. සියලු කුණු කසල අප පරම පියාට භාර දී ඔහුගෙන් ලෝක ස්වාධිපත්‍යය ලබාගන්නවා. ඔබ කියනවා: බාබා, භක්ති මාර්ගයේ දී අප ඔබට කීවා: ඔබ පැමිණියොත් අපගේ ශරීර, මනස සහ ධනය ආදීන් සමඟ අප සම්පූර්ණයෙන් ඔබට බාරවෙනවා කියා. භෞතික පියෙකුත් සිය දරුවන් හට බාර වෙයි. ඉතින්, මෙහි ඔබට රුවක් නැති පරම පියාව හමුවී තිබෙනවා. ඔහුව සිහිපත් කරන්න එවිට, ඔබේ පාප පිළිස්සී යාවි. මෙය එවන් වූ දුර ගමනකි. බලන්න පරම පියා පැමිණ සිටින්නේ කොතැනටද කියා. ඔහු පැමිණ සිටින්නේ පරණ රාවණ රාජ්‍යයටයි. ඔහු කියයි : පිවිතුරු ශරීරයක් ගැනීම මාගේ වාසනාවේ නොමැත. මා අපවිත්‍ර අයව පවිත්‍ර කිරීමට එන්නේ කොහොමද? මේ අපවිත්‍ර ලොවට ඇතුල් වී සියලු දෙනාවම පවිත්‍ර කිරීමට තිබෙයි. එබැවින්, එවන් වූ

ගුරුවරයාව ඔබ අගය කළ යුතුයි. ඔහුව අගය කළ යුත්තේ කෙසේද කියා බොහෝ අය නොදනී. මෙයද නාටකයෙහි සිදුවිය යුතු දෙයකි. රාජධානියක් තුළ සියල්ලන් අනුපිළිවෙලින් සිටීම අවශ්‍ය කරයි. ඉතින් ඒ සියලු වර්ග නිර්මිත වන්නේ මෙහිදීය. පහත් තනතුරක් ලබන්නන් ඉගෙන ගන්නේ හෝ පරම පියාගේ ස්මරණයෙහි රැඳී සිටීම නොකරති. ඔහු රුවක් නොමැති සුවිශේෂී පියෙක්. ඔහුගේ ක්‍රියාකලාප පවා අලෞකික වේ. අන් කිසිවකුට ඔහුගේ චරිත කොටස ලබාගත නොහැක. පරම පියා පැමිණ ඔබට උගන්වන්නේ එවන් වූ උසස් පාඩමකි! එමනිසා, ඔබත් ඔහුව අගේ කොට සැලකිය යුතුයි. ඔහුගේ ශ්‍රීමත් අනුගමනය කළ යුතුයි. කෙසේවෙතත්, මායා ඔබට නැවත නැවත අමතක කරවයි. මායා ඉතා බලවත් වාගේම හොඳ දරුවන්වත් ඇය වට්ටා දමයි. පරම පියා ඔබව ඉතා ධනවතුන් කරවන නමුත් මායා කරන්නේ ඔබට එක හෙළා පහර දීමයි. ඔබට මායාගෙන් බේරෙන්න අවැසි නම්, අනිවාර්යෙන්ම පරම පියා සිහිපත් කරන්න. පරම පියාට අයිති වූ අනගි දරුවන් පසුව මායාට අයති වී යනවා, අහන්නවත් එපා! ඔවුන් ප්‍රබල ද්‍රෝහීන් වෙනවා. මායා ඔවුන්ගේ නාසයෙන්ම අල්ලා ගෙන ඇත. කියමනක් තිබෙනවා: කිඹුලා ඇතෙක්ව ගිල්ලා කියා. කෙසේවෙතත්, එහි තේරුම නම් කිසිවකුත් නොදනී. පරම පියා සියල්ල ඉතා පැහැදිලිව විස්තර කරනවා. සමහර දරුවන් තේරුම් ගනී. එහෙත් එය ඔවුන් කරන උත්සාහයට අනුව අංක පිළිවෙලිනී. සමරුන්ට කිසිවක් කිසිසේත් ධාරණය කරගත නොහැක. මෙය එවන් වූ උසස් අධ්‍යාපනයකි! ඔවුන්ට ධාරණය කිරීම කළ නොහැක. පරම පියා කියයි : ඔවුන්ට රාජධානියේ වාසනාව නොමැති බව. සමහරු වරාමල් සහ අනෙක් අය සුවඳ මල් වේ. මෙය විවිධ මල් උයනකි. ඒ වාගේ අයත් උවමනායි. ඔබට රාජධානියක් තුළ දාස දාසියනුත් සම්බ වේවි. එසේ නැති කොට ඔබ දාස දාසියන් කෙසේ සොයා ගන්නද? රාජධානිය මෙහි නිර්මාණය වෙයි. ඔබට සියලු වර්ගයේ අය සම්බ වේවි : මෙහෙකාරියන්, මෙහෙකරුවන් සහ සොහොන්පල්ලන් ආදිය. රාජධානියක් නිර්මාණය වේ. එය ආශ්චර්යයකි! පරම පියා ඔබව ඉතා උසස් කරවයි. එමනිසා, එවන් පියෙකු සිහිපත් කරද්දී සෙනෙහසේ කඳුළු වැගිරිය යුතුයි: ඔබ රෝසරියේ ඇට බවට පත්වෙනවා. ඔබ කියයි: බාබා ඔබ බොහෝ අසහාය කෙනෙකි! අපිරිසිදු වූ අපව පාරිශුද්ධ කරන්නට ඔබ අපට උගන්වන අයුරු බලන්න. භක්ති මාර්ගයේ මිනිස්සු ශිවාට පුදපූජා කළාට, පාරිශුද්ධකරුවා ඔහු තමයි කියා නොදනී. ඒ වුණත් ඔවුන් නොකඩවා අඬගසන්නේ: ඕ පාරිශුද්ධකරුවාණෙනී, පැමිණෙන්න! පැමිණ අපව සුන්දර දේවතාවන් බවට පත්කරන්න. පරම පියා ඔය දරුවන්ගේ අණට අවනත වෙයි. ඔහු පැමිණී විට ඔහු කියයි : දරුවනී, පාරිශද්ධ වන්න. ගැටුම් ඇතිවන්නේ මේ නිසායි. පරම පියා පුදුම සහගතයි. ඔහු ඔබ දරුවන්ට කියයි : මා සිහිපත් කළ විට ඔබේ පාපයන් කැපී යාවි. පරම පියා කතා කරන්නේ ඔය ජීවාත්මයන්ට බව ඔහු දන්නවා. සියල්ල කරන්නේ ජීවාත්මයන්. පාප ක්‍රියා කරන්නේ ජීවාත්මයන්. ඉන්පසු ඔවුන්ගේ ශරීර තුළින් විඳවන්නේත් ජීවාත්මයන්මය. ඔබ වෙනුවෙන් අධිකරණයක් තිබේවි. විශේෂයෙන්, එය සේවයට යෝග්‍ය වූ දරුවන් පසුව ද්‍රෝහීන් බවට පත්වූ අයටයි. මායා ඔබව ගිල දැමූ ආකාරය දන්නේ පරම පියා පමණයි. බාබා, මා පරාද වුණා, මගේ මුහුණේ දැළි ගා ගත්තා... දැන් මා හට සමාවෙන්න! ඔබ පහළට වැටී මායාට අයිති වී සිටියි. ඉතින් ඊට සමාව කෙසේ ලැබෙන්නද? එම ජීවාත්මයන් බොහෝ සේ උත්සාහ දැරීමට සිදු වේ. එසේ මායා නිසා පරජිත වූවන් බොහෝ දෙනෙක් සිටී. පරම පියා කියයි : මෙහිදී පියාට දානය දුන් පසු එය නැවත නොගන්න. එසේ නැතිනම්. සියල්ල අහවර වේවි. හරිස්චන්ද්‍රගේ උදාහරණයක් තිබෙයි. දානයක් කළාට පසු ඉතා ප්‍රවේශම් විය යුතුයි. ඔබ එය ආපසු අර ගත්තොත්, ඊට ලැබෙන දඬුවම සිය ගුණයකි. ඉන්පසු ඉතා පහත් තත්ත්වයක් ලැබෙයි. රාජධානියක් ස්ථාපනය වෙමින් තිබෙන බව ඔය දරුවන් දන්නවා. ධර්මය ස්ථාපිත කළ අනෙක් සියල්ලන්ටම ආරම්භ කාලයේ රාජධානියක් නොතිබේ. රාජධානියක් ඇතිවිය හැක්කේ මිලියන පහක් හෝ හයක් පමණ සිටින විටයි. එවිට විශාල සෙනඟක් සිටිය හැකියි මුලින් එක්කෙනෙක් දෙදෙනෙක් පැමිණේ පසු කෙමෙන් වර්ධනය සිදු වේ. ඔබ දන්නවා ක්‍රිස්තු යම් ස්වරූපයෙන් ඒවි. අංක එකේ සිටි කෙනා නියතවම අන්තිම අංකයේ යාචක ස්වරූපයෙන් සිටීවි. ක්‍රිස්තියාණීන් එසැන කියාවි. මෙකල කොතැනක හෝ යාචක ස්වරූපයෙන් ක්‍රිස්තු ඇවිත් සිටිනවා ඇතැයි කියා. එයින් ඔහු යළි ඉපදිය යුතු බව වටහාගත හැක. සියල්ලන්ම නියතවම තමෝප්‍රධාන් වීමට ඇත. මෙකල. මුළු ලොවම ඇත්තේ තමෝප්‍රධාන් සහ සම්පූර්ණයෙන් ජරාවට පත් තත්ත්වයෙනී. අනිවාර්යෙන් මේ පරණ ලොව විනාශ වීමට ඇත. ක්‍රිස්තියාණීන් පවා කියන්නේ ක්‍රිස්තු වර්ෂ 3000කට පෙර ස්වර්ගයක් තිබුණි. එය නැවතත් ඇතිවේවි කියායි. කෙසේවෙතත්, කවුද මේ සියලු දේ පැහැදිලි කරන්නේ? පරම පියා කියයි : දරුවන් තවමත් එම තත්ත්වයට ඇවිත් නැහැ. ඔවුන් නැවත නැවත ලියමින්, කියමින් සිටින්නේ : මට යෝගාවෙහි ඉඳින්න බැහැ. දරුවන්ගේ ක්‍රියකලාපයෙන්ම බාබාට වැටහෙයි. බාබාට ඔවුන්ගේ විස්තර දීමට පවා බිය වෙති. පරම පියා දරුවන්ට බොහෝ සේ සෙනෙහස දක්වයි. ඔහු සෙනෙහසින් ඔබට නමස්කාර කරයි. එහෙත් දරුවන් අහංකාරයි. මායා ඉතා හොඳ දරුවන්ට පවා අමතක කරවනවා. බාබාට එය

වැටහෙනවා. ඔහු කියයි : මා ඥානාන්විතයි. ජනීජනන්හාර් (සියල්ල දත් කෙනා) ඒ කියන්නේ මා සෑමදෙනා තුළම තිබෙන දේ දැන සිටිනවා කියා නොවෙයි. මා මෙහි පැමිණියේ ඔබට උගන්වන්නද නැතිනම් ඔබේ සිත කියවන්නද? මා කිසිම කෙනෙකුගේ සිත කියවන්නේ නැහැ. මේ භෞතික කෙනා පවා කිසිවකුගේ සිත කියවන්නේ නැහැ. ඔහු සියල්ලක්ම අමතක කරන්න ඕන. ඉතින් ඔහු මොනවා කියවන්නද? ඔබ මෙහි ආවේ ඉගෙන ගන්නයි. භක්ති මාර්ගය වෙනම එකක්. වැටීමට හේතුවක් තිබෙනවා. එම දේවල් වලින් පමණයි ඔබ වැටෙන්නේ. මෙම රඟදැක්වෙන නාටකය කල්තියා නියම වූවකි. භක්ති මාර්ගයේ ග්‍රන්ථයන් කියවීමෙන් සහ පහළට ඒමෙන්, ඔබ තමෝප්‍රධාන් වෙයි. ඔබට තවත් මේ කිළිටි ලොවේ සිටීම අවශ්‍ය නොවේ. යකඩ යුගයෙන් පසු ස්වර්ණම යුගය ඇතිවේවි. දැන් මේ සංගම යුගයයි. මේ සියලු කාරණා ධාරණය කරගන්න. මේ කාරණා පැහැදිලි කරන්නේ පරම පියා පමණයි. ලොවේ අනෙකුත් සියලු දේවල් ඔබේ බුද්ධියට අගුළු (ගොරේජ් ලොක්) දමයි. එම දිව්‍යමය ගුණධර්ම තිබූ අයයි දැන් යක්ෂ ගති ඇතිව සිටින්නේ යන්න ඔබ දනී. පරම පියා පැහැදිලි කරයි : දැන් භක්ති මාර්ගයේ සියලු දේවල් අමතක කරන්න. දැන් මා කියනා දේවල් පමණක් සවන් දෙන්න. අයහපත් දේවල් නොදකින්න. දැන් සවන්දෙන්න මට පමණක්, දැන් ඔබව එගොඩ කරන්නයි මා පැමිණ සිටින්නේ. ඔබ දේවමය සමූහයයි. ඔබව නිර්මාණය කරන ලද්දේ ප්‍රජාපිතා බ්‍රහ්මාගේ කමල මුඛයෙන්. ඔය සියල්ලන්ම බාරගත් දරුවන්ය. ඔහුට ආදී දේව් කියති. ඔහුට මහාවීර් කියාත් කියති. ඔය දරුවන්ද යෝග බලයෙන් මායා ජයගත් මහාවීරයන් වේ. ඥාන සාගරය කියන්නේ පරම පියාටයි. ඥාන සාගරය වූ පරම පියා ඔබට තැටියක් පිරෙන්න අවිනාශී ඥාන මිණිමුතු දෙයි. ඔහු ඔබව ඉතා සසිරිමත් අය කරවයි. ඥානය ධාරණය කරගත් අය උසස් තත්ත්වයක් ලබාගනී. එය ධාරණය නොකරන අය නියතවම පහත් තත්ත්වයක් ලබාගනීවි. ඔබ පරම පියාගෙන් අප්‍රමාණ ධනවස්තු ලබනවා; අලාහ්යුදීන්ගේ කතාවක් තිබෙනවා (ඇලඩින් සහ මැජික් පහන). එහි කිසිම දෙයක අඩුවක් නැති බවත් ඔබ දන්නවා. පරම පියා ඔබට උපත් 21ක් සඳහා උරුමය දෙනවා. අසීමිත පියා ඔබට දෙන්නේ අසීමිත උරුමයක්. සීමිත උරුමයක් ලබද්දී පවා මිනිසුන් නියතවම අසීමිත පියාව සිහිපත් කරන්නේ : ඕ දෙවියනි, කරුණාව දක්වන්න! ආශීර්වාද කරන්න! ඔහු ඔබට කුමක් දෙයිද කියා කිසිවකුත් නොදනී. දැන් ඔබ දන්නවා ඒ බාබා ඔබව ලොවට හිමිකරුවන් කරවනවා කියා. බ්‍රහ්මා මාර්ගයෙන් ස්ථාපනය සිදුවෙයි කියා පින්තූරයේත් පෙන්වා ඇත. බ්‍රහ්මා ඔබ ඉදිරියේ සාමාන්‍ය ස්වරූපයෙන් ඉඳිනවා. ස්ථාපනය සිදුවන විට සැබැවින්ම ඊට උපකරණයක් කරන්නේ ඔහුවයි. පරම පියා ඉතා දක්ෂ ලෙස පැහැදිලි කරයි. සම්පූර්ණයෙන් පැහැදිලි කිරීම ඔබට කළ නොහැකියි. භක්ති මාර්ගයේ මිනිස්සු ශංකර් හමුවට ගොස් කියයි: අපගේ සාළුව පුරවන්න. ජීවාත්ම කියයි: දුගී දුප්පතෙක්! මාගේ සාළුව පුරවන්න! මා එලෙස පත්කරන්න! දැන් ඔබ මෙහි ඔබේ සාළුව පුරවා ගැනීමට පැමිණ සිටියි. ඔබ කියනවා ඔබට සමාන්‍ය මිනිසාගෙන් නාරායන බවට පත්වෙන්න ඕන කියා. මෙම ඉගෙනුම සාමාන්‍ය මිනිසාව නාරායන බවට වෙනස් කරවනවා. පරණ ලොවට යාමට උවමනාව ඇත්තේ කාටද? කෙසේවෙතත්, සියල්ලන්ම නොවෙයි නව ලොවට යන්නේ. 25%ක් පමණ අය පරණ ලොවට ඒවි. එහෙනම්, අනිවාර්යෙන් යම් දෙයක අඩුවක් තිබෙයි. ඔබ කෙනෙකුට පණිවුඩය ටිකක් දුන්නත් පවා ඔබ නියතවම දිව්‍ය ලොවේ හිමිකරුවෙක් වෙනවා ඇත. දැන් සෑම කෙනෙක්ම පාහේ අපායේ හිමිකරුවෙකි. රජ රැජින සහ පුරවැසි සියල්ලෝම අපායේ හිමිකරුවන් වේ. එහිදී ඔවුන් ද්විත්ව කිරුළු පළඳී. ඔවුන් දැන් එසේ නොවේ. මෙකල කිසිවකුටත් ආගමෙහි විශ්වාසය නොතිබේ. දේවතා ධර්මය අවසන් වී ඇත. මෙසේ සිහිපත් කර ඇත: ධර්මය බලයකි. ආගම ධර්මයේ විශ්වාස නොකරන අය නිසා එහි බලය ඉතිරිව නැත. පරම පියා පැහැදිලි කරයි : සුමිහිරි දරුවනී, වන්දනීය වූ ඔබ වන්දනාකරුවන් වී සිටිනවා. ඔබ උපත් 84ක් ගෙන තිබෙනවා නේද? අප බ්‍රහමින්වරු තමයි පසුව දේවතාවන් වන්නේත් ඉන්පසු ක්ෂත්‍රියන් වන්නේත්, මුළු චක්‍රයම ඔබේ බුද්ධියට ඇතුල් වෙයි. අප නොකඩවා උපත් 84 චක්‍රයේ ගමන් කර දැන් අප ආපසු නිවසට යාමට සිටිනවා. එහි අපවිත්‍ර අයට යා නොහැක. පවිත්‍ර වන්නේත් අපවිත්‍ර වන්නේත් ජීවාත්මයන්ය. රත්රන් වලටයි වෙනත් ලෝහ මිශ්‍ර කරන්නේ. ආභරණ වලට නොවේ. ඔබේ සියලු මිශ්‍රණ ඉවත්ව යන්නේත් එසේම ඔබ නියම රත්රන් බවට පත්වන්නේත් මෙම ඥාන ගින්න මගිනී. අනතුරුව ඔබට එවන් වූ ලස්සන ස්වර්ණාභරණ ලැබෙනවා ඇත. ජීවාත්ම දැන් අපවිත්‍රයි. එමනිසා, ඔවුන් පාරිශුද්ධ අය හමුවේ හිස නමති. සියල්ල කරන්නේ ජීවාත්මයන්ය. පරම පියා දැන් පැහැදිලි කරනවා : දරුවනී. සරළව මා පමණක් නිරන්තරව සිහිපත් කරන්න. එවිට ඔබේ ඔරුව එතෙරට යාවි. ඔබ පාරිශුද්ධ වී පාරිශුද්ධ ලොවට යනවා ඇත. දැන් ඔබ සෑම කෙනෙක්ම කරන උත්සාහය මත එය රැඳී ඇත. සෑම කෙනෙකුටම මෙම හැඳින්වීම නොකඩවා ලබාදෙන්න. ඒ අය සීමිත පියවරුන් වන අතර මොහු අසීමිත පියා වේ. මේ සංගම යුගයේදී පමණයි පරම පියා පැමිණ දිව්‍යලෝක උරුමය ඔබට ලබා දෙන්නේ. එමනිසා, එවන් පියාව ඔබ සිහිපත් කළ යුතුයි. ශිෂ්‍යයන් කිසිදා තම ගුරුවරයාව

අමතක කරයි ද? කොහොමවෙතත්, මෙහිදී, මායා දිගටම ඔබට අමතක කරවයි. ඔබ ඉතා ප්‍රවේශමෙන් ඉන්න ඕන. මෙය යුධ පිටියක්. පරම පියා කියයි: දැන් පාපයට ඇද වැටෙන්න එපා! කිළිටි වෙන්න එපා! ඔබ දැන් දිව්‍යලෝකෙට යාමටයි සිටින්නේ. පාරිශුද්ධ වීමෙන් පමණයි ඔබ පාරිශුද්ධ නව ලොවේ හිමිකරුවන් වනවා ඇත්තේ. මා ඔබට ලෝක ස්වාධිපත්‍යය දෙනවා. මෙය සුළුපටු දෙයක් ද? සරළව මේ එක් උපතේ පාරිශුද්ධ වන්න. ඔබ දැන් පාරිශුද්ධ නොවුවොත් ඔබ පහළට ඇද වැටේවි. බොහෝ සේ පෙළඹවීම් එහි ඇත. පාපය ජය ගැනීම මගින් ඔබට ලොවේ හිමිකරුවන් වීමට හැකිවේවි. ලොවටම ගුරු වන. සමස්ථ ලොවටම සත්ගතිය පිරිනමන කෙනා පරම්පිතා පරමාත්මයයි කියා ඔබට පැහැදිලිව ඔවුන්ට කිව හැකියි. අච්චා.

සුමිහිරි ආදරණීය බොහෝ කලක් නැති වී සිට දැන් හමු වුණ දරුවන්ට ඔබගේ මව, පියා, බාප්දාදා සෙනෙහසින් සිහිපත් කර සුබ උදෑසනක් ප්‍රාර්ථනා කරයි. ආධ්‍යාත්මික පියාගෙන් ආධ්‍යාත්මික දරුවන්ට නමස්කාර.

**ධාරණය සඳහා සාරාංශය:**

1. ඔබේ බුද්ධියේ සාළුව අවිනාශී ඥානරත්න වලින් පුරවා සසිරිමත් වන්න. මොනයම් විදියේ අහංකාරයක් වත් නොපෙන්වන්න.
2. සේවය කිරීම සඳහා යෝග්‍ය අය වීමෙන් පසු ද්‍රෝහියකු හෝ අවසේවය කරනා අය බවට පත්නොවන්න. දානයක් දුන් පසු ඉතාමත්ම ප්‍රවේසම් විය යුතුයි; කිසිසේත් එය ආපසු ගැනීමට සිතන්නවත් එපා.

**වරදානය:** පරමාත්ම දෙවියන්ගේ ආලෝකය සමග ඍජු සම්බන්ධයක් ඇති නිසා ඔබ අඳුර පහ කරන ප්‍රදීපාගාරයක් බවට පත්වේවා.

ඔය දරුවන්ට පරමාත්ම දෙවියන්ගේ ආලෝකය සමග ඍජු සම්බන්ධතාවයක් තිබේ. සරළව ඔබේ ස්වයං ගරුත්වයේ ස්විජය දමා එය ඍජු සම්බන්ධතාවයේ ධාරාවට සම්බන්ධ කළ විට එතැන ආලෝකය තිබෙනු ඇත. කොතරම් නම් අඳුරින් යුතු වළාකුළු, සූර්යාලෝකය සඟවා තැබීමට උත්සාහ කළද, ඔවුන්ද නොපෙනී යනවා ඇත. මේ ආකාරයට, ඔබ ඔබ විසින්ම ආලෝකයෙන් සිටින අතර ඔබ අන් අය වෙනුවෙන් ද ප්‍රදීපාගාරයක් වනවා ඇත.

**පාඨය:** ඔබ ගැන ඔබ දරන උත්සාහයේ දී දැඩි වනවිට ඔබේ කම්පන වලින් අන් අයගේ මායා ඉක්මනින් පලා යනු ඇත.

***** ඔම ශාන්ති *****